## ග්‍රාපික ප්‍රරූප (Graphic types)

අංකිත ග්‍රාපිකය ප්‍රධාන වශයෙන් ප්‍රරූප දෙකකි. එනම් රාස්ටර් ග්‍රාපික (Raster graphic) සහ වෙක්ටර් ග්‍රාපික (Vector graphic) යනුවෙනි. ග්‍රාපිකය දෙයාකාරයක් වන්නේ පරිශීලකයා විසින් නිර්මාණයේ දී යොදා ගනු ලබන ග්‍රාපික මෘදුකාංගයට අනුව ය.

## රාස්ටර් ග්‍රාපික සහ වෙක්ටර් ග්‍රාපික අතර වෙනස

| | රාස්ටර් ග්‍රාපික (Raster graphic) | වෙක්ටර් ග්‍රාපික (Vector graphic) |
|---|---|---|
| ග්‍රාපික නිර්මාණය | විවිධ වර්ණයෙන් යුතු පික්සල් ආරාවකින් ය | ඍජු හෝ වක්‍ර රේඛා එකට එකතු වීමෙනි |
| ගොනු සටහන් | නොමැත | නිර්මාණයේ ආරම්භය, අවසානය, කොපමණ රේඛා ප්‍රමාණයක් ද, ඍජු හෝ වක්‍ර රේඛා ද යොදු ගනු ලබන වර්ණ පිළිබඳ සටහන් ඇත. |
| ග්‍රාපිකයේ ගුණාත්මක බව | පරිමාව වෙනස් කිරීමේ දී ගුණාත්මක බව විනාශ වී යයි | පරිමාව වෙනස් කිරීමේ දී ගුණාත්මක බව වෙනස් නොවේ |
| උසස් නිර්මාණ සඳහා | සුදුසු නොවේ | සුදුසුයි |
| නිර්මාණය කිරීම සහ තැන්පත් කිරීම | පරිගණක මතකයේ ධාරිතාව අඩුවෙන් යොදු ගනියි | පරිගණක මතකයේ ධාරිතාව වැඩියෙන් යොදු ගනියි |
| නිර්මාණයේ දී පරිගණකයේ ක්‍රියාකාරි වේගය | වෙනස් නොවේ | අඩු කරයි |
| මෘදුකාංග කිහිපයක් | Adobe Image Ready, Adobe Photoshop,ProArtRage, Artweaver, Corel PHOTO-PAINT, GIMP, Deluxe Paint, GIMP shop, Microsoft Photo Editor | Adobe Illustrator, Adobe Live Motion, Corel Paint Shop Pro, Adobe Fireworks, Microsoft Expression Design, DrawPlus, X ara Photo & Graphic Designer, CorelDRAW, Litha-Paint |

